කො/දේවිබාලිකාවිද්‍යාලය - කොළඹ

පළමු වාරපරීක්ෂණය - 2016 (මාර්තු)

ඉතිහාසය- I

10 ශ්‍රේණිය

කාලය පැය 2යි

❖ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) සාහිත්‍ය මූලාශ්‍රයක් නොවන්නේ,

i. මහාවංශය
ii. දීපවංශය
iii. අභිලේඛන
iv. වදා හෙළදිව

2) ඉතිහාසය හැදෑරීමට ඉවහල්වන දෑ හැඳින්වෙන්නේ,

i. මුල ධර්ම ලෙසය
ii. සෙල්ලිපි යනුවෙනි
iii. කාසි
iv. මූලාශ්‍රය

3) ශ්‍රී ලංකාව මුලින්ම ජනාවාස කරන ලද්දේ,

i. හෝමෝ සාපියන් මානවයා විසිනි.
ii. හෝමෝ පිතිකස් මානවයා විසිනි.
iii. බලන්ගොඩ මානවයා විසිනි.
iv. හෝමෝ හැබිලස් මානවයා විසිනි.

4) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කාලය වන්නේ,

i. ක්‍රි.පූ.එක් ලක්ෂ විසිපන් දහසේ පමණ සිටය.
ii. ක්‍රි.පූ.දෙදහස් හාරසීයේ පමණ සිටය.
iii. ක්‍රි.පූ.පන්දාහේ පමණ සිටය.
iv. ක්‍රි.පූ.තුන්සීයේ පමණ සිටය.

5) සංදේශ කාව්‍යයක් වන්නේ,

i. පැරකුම්බා සිරිත
ii. සීතාවක සටන
iii. සැලලිහිණි සංදේශය
iv. ගුත්තිලය

➢ හිස්තැනට ගැලපෙන වචනය යොදා වාක්‍යය සම්පූර්ණ කරන්න.

1) මෙරටින් හමුවන පැරණිතම කාසි ______________________ ලෙස හැඳින් වේ.

2) ඉරණමඩු තැන්පතු සකස් වූයේ ______________________ යුගයේ පැවැති කෙටි උණුසුම් කාල වලදීය.

3) මුල් ඓතිහාසික යුගය වශයෙන්සැලකෙන්නේ ක්‍රිස්තු පූර්ව 450 පමණ සිට ක්‍රිස්තු වර්ෂයෙන් ______________ වන තුරු කාල පරිච්ඡේදයකි.

4) කුවේණිය ඇතුලු ස්වදේශික පිරිස ______________________ යුගය නියෝජනය කරයි.

5) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය ______________________ ලෙස සැලකේ.

---

## **II කොටස**

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) ඔබට ලබාදී ඇති ලංකා සිතියමේ දී ඇති ස්ථාන ලකුණු කරන්න.
මානියන්ගම, අලිගල, පොතාන, පිදුරන්ගල, ගාල්ල, රත්නපුරය, අනුරාධපුරය, ඉරණමඩු, එලිෆන්ට්පාස්, මුලතිව්.

2) i. ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය 2ක් නම් කරන්න. (ලකුණු 4)
ii. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු 4ක් නම් කරන්න. (ලකුණු 4)
iii. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වලට උදාහරණ 5ක් ලියන්න. (ලකුණු 5)
iv. සෙල්ලිපි යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07)

3) i. කාසි අධ්‍යයනය මගින් ලැබෙන ප්‍රයෝජන 2ක් සඳහන් කරන්න. (ලකුණු 4)
ii. මෙරට භාවිතා වූ කාසි වර්ග 4 ක් නම් කරන්න. (ලකුණු 4)
iii. ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන 5ක් ලියන්න. (ලකුණු 5)
iv. ''පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂාකර ගැනීම'' පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 7)

4) i. ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස ජීවන රටාව හා තාක්ෂණය අනුව බෙදුන ප්‍රධාන කොටස් 2 නම් කරන්න. (ලකුණු 4)
ii. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස වල ස්වරූපය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)
iii. ඔවුන්ගේ ආහාර රටාව පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)
iv. ගල් යුගයේ පැවැති අභිචාර විධි පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 4)